
THE SINHALA
2010 Aug.
ISSN: 1834-7061
pp. 11-14

# මව් සෙනෙහස



"මොකද උඹ ඔතන බලාගෙන ඉන්නෙ. අර පියන මෙහාට ගනින්, මේ තෙල් ටික දාන්න."
ගරාජයේ පරණ ලොරියක් යට වැඩ කරමින් සිටි පුද්ගලයාට, සිරිතුංග බෙරිහන් දෙන්නට විය. ඒ දෙස බලා සිටි ජයදාස තිගැස්සිණි. වහා ලඟ තිබූ පියන ගත් ජයදාස එය පුද්ගලයා දෙසට දිගු කළේය.

"උඹ කවුද? මොකද මෙතන කරන්නෙ?
මම හිතුවෙ අර පියදාස කොළුව කියල. පියදාස කොහාට හරි පැනල ඇති. ඌ නම් කවදාවත් වැඩ ඉගෙන ගන්න එකෙක් නෙවි."

ලොරිය යටින් එළියට ආ පුද්ගලයා බෙරිහන් දෙන්නට විය.

"අනේ මහත්තයෝ, මම මහත්තය වැඩ කරන හැටි බලාගෙන හිටිය. මට හරියට ආස හිතුණ නිසා."

ජයදාසගේ වෙව්ලන බැගෑපත් හඬට සිරිතුංගට දුක හිතුණි.

"උඹ කොහේද ඉන්නෙ?" "ඉන්න තැනක් නැහැ. මම අනාථ වුණ කෙනෙක්."

"මොකක් කීව?" සිරිතුංග ඇහුවේ හරිම කරුණාවෙන්.

"මම අනුරාධපුරයේ දියවඩන ගමේ. ත්‍රස්තවාදියො අපේ ගමට ඇවිල්ල මුළු ගමම විනාශ කළා. අපේ අම්මයි, තාත්තයි, නංගියි, අයියයි ඔක්කොම මැරුම් කෑව, මම කැලේ පැනල ඉඳල ලොරියක නැගල කොළඹට ආව."

*ජයදාසට දින කීපයක් යනතුරු නිදාගැනීමට නොහැකි විය. නිතරම අම්මාව හීනෙන් දකින ජයදාස ක්‍රමයෙන් මේ ජීවන රටාවටම හුරු විය.*

බොරු කීමේ ආදීනව ගැන ධම්මසාර හාමුදුරුවන්ගේ අනුශාසනා මතක් වූවත්, මෙය ඒ ගැන සිතීමට වේලාවක් නොවන බව ජයදාසට සිතුණි. නිතැතින්ම ඔහුගේ දෑසට කඳුළු නැගුණේ, මේ වන විට තමා සොයමින් දුක්වන පවුලේ අය මතක් වන විටය.
"එතකොට උඹ කොහොමද මේ මඩලන්දට ආවෙ."
සිරිතුංගගේ හිත හොඳටෝම උණුවෙලා.
"දවස් තුනක් ඇවිද ගෙන, ඇවිද ගෙන හිස හැරුණ අත ආව."
"මොකක්ද උඹේ නම?"
"ජයදාස වයස 16 යි."
"උඹ කාලද ඉන්නෙ?"
"අනේ නැහැ දවස් තුනකින් හරියට කෑමක් නැහැ."
"පියදාස මෙහෙ වරෙන්. අර කඩේට ගිහිල්ල කෑම තුනක් අරන් වරෙන්. මෙන්න සල්ලි."
"තුනක් මොකටද මාමෙ.? මෙයා කවුද කියලවත් අපි දන්නවද?"
"උඹට මේ පණ්ඩිත කමක් ඕන නැහැ. මම කියපු වැඩේ කරපන්."
පියදාස ගස්සාගෙන කඩය දෙසට ගියේ, ලොකු තරහකින් මොනවදෝ තොල් මතුරමිනි.
"උඹ දැන් කොහේද යන්නෙ?"

"යන්න තැනක් නැහැ මහත්තයෝ."

"මට සිරිතුංග මාම කියපං. එහෙනම්, උඹ කැමති ද මෙහේ ඉඳගෙන මේ වැඩ ඉගෙන ගන්න ."

මේ සමඟ කෑම රැගෙන පැමිණි පියදාස, "අනේ අනේ අර ගුත්තිල තුමාට උන දේ වෙව්ද දන්නෙ නැහැ, අපේ සිරිතුංග මාමාට."

"කට වහ ගනින් පියදාස. උඹ තමයි කවදහරි මූසිලය වෙන්නෙ. මේ ජයදාස කොළුවගෙ හරිම සීදේවි පෙනුමක් තියෙනව."

"උඹ මේ පියදාසත් එක්ක මඩුවෙ නිදාගනින්. හොඳට මේ රස්සාව ඉගෙන ගනින්. හැබැයි බොහෝම අවංකව හොර, බොරු, වංචා නැතුව වැඩේ කරල දීල, සාධාරණ කුලියක් අරගෙන, සතුටින් වැඩ ඉගෙන ගනින්. ඒ සතුට සදාකාලිකයි."

"හොඳමයි මාමේ." සිරිතුංග මාමා ඉදිරියේ ජයදාස වැඳ වැටුණේ කෘත ගුණ සැලකීමට.

ජයදාසට දින කීපයක් යනතුරු නිදාගැනීමට නොහැකි විය. නිතරම අම්මාව හීනෙන් දකින ජයදාස ක්‍රමයෙන් මේ ජීවන රටාවටම හුරු විය. දක්ෂ කාර්මිකයෙක් වීමට ඇති උද්යෝගය නිසා ගම, තම මව ඇතුළු සියල්ල ජයදාසගේ මතකයෙන් ක්‍රමයෙන් මැකී ගියේ නොසිතූ ලෙසිනි. මෙය පෙර ආත්මයක පැතුමක් වෙන්න ඇති. පියදාසගේ එදිරිවාදිකම ඉවසමින්, ඔහු සමඟ මිත්‍ර වූ ජයදාස දින, සති, මාස, අවුරුදු ගතවෙද්දී ඉතා දක්ෂ ලෙස කාර්මික වැඩ ඉගෙන ගත්තේ, ඒ හැම දෙනාගේම සිත් දිනා ගනිමින්. වාහනයක් පැමිණෙන හඬින්ම, එහි ඇති දෝෂය සොයා ගන්නා, ඔහුගේ දක්ෂකම දත් බොහෝ දෙනා, තම වාහනය සාදවා ගැනීමට ජයදාසටම බාර දෙයි. සිරිතුංග මාමාට මේ නිසා ඇතිවූ සතුට කියා නිම කළ නොහැකි විය.

ජයදාස, සිරිතුංග ගරාජයට ඇවිත් දැන් අවුරුදු 10 ක් විතර ඇති. වැඩ අධිකකම නිසා ගරාජයේ සේවක ගණන 12 දක්වා වැඩි විය. අවට ගම් වලින් පමණක් නොව, රජයේ වාහන ද දැන් සිරිතුංග ගරාජයට එන්නේ, ජයදාසගෙන් වැඩකර ගැනීමටය. ඒ සියල්ල සිරිතුංග මාමා කියූ පරිද්දෙන්ම, ජයදාස ඉටුකළේ සන්සුන්ව, ඉතා සතුටින්ය. යාබද ඉඩම ද මිලට ගත් සිරිතුංග මාමා, තම ගරාජය දියුණු කළේ සියළුම සේවකයින්ගේ සිත් දිනා ගනිමිනි. තම ව්‍යාපාරයේ දියුණුවට ගෙන ආවේ ජයදාස පුතා බව, සිරිතුංග මාමා නිතරම කියයි.

"ජයදාස පුතේ, උඹත් දැන් මෙහාට ඇවිල්ල අවුරුදු 12 ක් ගතවුණා. උඹ මගේ ව්‍යාපාර හොඳට වැඩි දියුණු කළා. හැමෝගෙම හිත දිනා ගත්තා. ඉතාමත් සාධාරණව හොඳට සේවය කරනවා. දැන් ඉතින් උඹටත් යන කලදසාවක් තියෙන්න ඕන නේ."

"ඒක තමයි පුතේ. අපිටත් දරුවෙක් මල්ලෙක්වත් ඉන්න එකක් යැයි. උඹ ගිය ආත්මෙක මගේම දරුවෙක් වෙන්න ඇති." එසේ කියූ නැන්දා දෑස පියා ගත්තා.

"උඹට මතකද පුතේ අර අපිට නිතරම වාහන ගේන සඳකැලුම් ව්‍යාපාරය? ඒකෙ මුදලාලියි, මමයි එකට ඉස්කෝලෙ ගියේ. ඒ කාලෙ ඉඳලම හරිම යාලුවො. ඒ මුදලාලිත් හරිම සාධාරණ කරුණාවන්ත කෙනෙක්."

"ඉතින් මාමෙ." ➔

National Library of Australia: ISSN-7061
Printed in Australia.

"එයා උඹ ගැන හොඳටෝම පැහැදිලා. දවසක් මගෙන් ඇහුව, එයාගෙ දුවව උඹට කතාකරමුද කියල. හරිම හුරු බුහුටි කරුණාවන්ත ගෑනු ළමය. උඹ මොකද කියන්නෙ. ඒ ළමයගේ නම ප්‍රියංවදා. ඒ ළමයටම ගැලපෙන නම."

"මමත් ඔය ප්‍රියංවදාව දවස් කීපයක් දැකල තියෙනව මාමෙ. මෙහාට ආව කීප විටක්ම මුදලාලිත් එක්ක."

"අනේ ඔව් පුතේ. හරිම අහිංසක ගුණ යහපත් කෙල්ල. කිසිම ආඩම්බර කමක් නැහැ. ගමේ පොදු වැඩ පංසලේ වැඩ හරිම උනන්දුවෙන් කරනව. එහෙම නම් මම මුදලාලිට කියන්නම්, උඹේ අකමැත්තක් නැහැ කියල. මම උඹ ගැන විස්තර ඔක්කෝම මුදලාලිට කීවා."

ජයදාස සහ ප්‍රියංවදා යුග දිවියට ඇතුල්වී, දැනට වසර තුනක් ගතවී ඇති බව සිතාගත නොහැක. දෙහැවිරිදි සඳකැන් පුතාගේ පැමිණීමෙන්, ඔවුන්ගේ දිවිය තව තවත් ආලෝකමත් වූ බව ජයදාස සිතන්නේ මහත් සතුටින්.

"මාම දැන් වැඩ කරන්න ඕන නැහැ. මම ඔක්කොම බලාගන්නම්. මාම ගිහිල්ල ගෝලයො හරියට වැඩ කරනවද විතරක් බලන්න. දැන් මාමයි නැන්දයි ටිකක් විවේක ගන්න."

දැන් ලංකාව සන්සුන් නිසා, ලබන මාසෙ වට වන්දනාවක යන්න ලෑස්ති වෙන්න.

"හා හොඳයි පුතේ."

"දැන් ලංකාව සන්සුන් නිසා, ලබන මාසෙ වට වන්දනාවක යන්න ලෑස්ති වෙන්න. මම අර බෙන්ස් එක හොඳට හදන්නම්. පියදාස එක්කම යන්න පුළුවන්."

"ඒක නම් හොඳයි පුතේ. වන්දනාවක ගිය කාලයක් මතක නැහැ. මේ යුද්ධ කලබල නිසා. මේ ආණ්ඩුවටයි, හමුදාවටයි පිං සිද්ද වෙන්න, දැන් බයක් නැතුව ඕනම තැනක අපට යන්න පුළුවන්."

"ගමනට අර කිරි නැන්දයි, සුදු මාමයි එක්කර ගන්න. කිරි නැන්ද, නැන්දගෙ නංගි නිසා ගමනට හොඳට ගැලපෙනවා. අනික කිරි නැන්දා ඉතිහාසෙ ගැන හොඳටෝම දන්නව. ඉස්සර උගන්නපු නිසා. මම එහෙනම් හොඳ හෝටල් ටිකකුත් සූදානම් කරන්නම්.''

"එහෙම නම් පුතේ අපිට තිස්සමහරාමය වැඳල, කතරගම පැත්තෙන්ම ගිහිල්ල, බදුල්ලේ මුතියංගණය වැඳ ගන්න පුළුවන් නේ. ඊට පස්සෙ මයියංගණය හරහා දළදා මාළිගාව වැඳ ගෙන, ලබන පෝයට දළදා මාලිගාවෙම සිල් ගන්න සූදානම් කරන්න. ඊට පස්සේ අනුරාධපුරයේ අටමස්ථානයත් වැඳලම ගමට එන්න පුළුවන්."

"අනේ ජයදාස පුතේ, උඹ නම් ගිය ආත්මෙක අපේම දරුවෙක් වෙන්න ඇති. ඒකයි දෙවියො උඹව මෙහාටම එව්වෙ. නැතිනම් අපට කිසිම හයියක් නැහැ. ගරාජයත් එහෙනම් දැනටමත් වහල දාල."

"එහෙම කියන්න එපා. මාම කොච්චර හොඳට වැඩ කරල තියෙනවද? පින් දහම් කරල තියෙනවද? හැමෝම වගේ මාම ගැන කියන්නෙත් හොඳමයි."

ඉරිදා දිනයක් නිසා ගරාජයේ වැඩ කරන අයට නිවාඩු. හැම දෙනාම කතා කළේ හරිම සැහැල්ලුවෙන්. හවසට කැළණි විහාරයට යන්නයි සූදානම් වෙලා හිටියෙ.

"ප්‍රියංවදා, අපේ නායක හාමුදුරුවන් වහන්සෙයි, පොඩි උන්නාන්සෙයි, දායක සභාවයි මෙහාට වඩිනව වගේ. ඉක්මනට සුදු රෙදි දාල ආසන දෙකක් සූදානම් කරන්න."

"ජයදාස මහත්තයෙෝ, අද ඉරිද නිසා මම හිතුව ගෙදර ඇති කියල."

"එහෙමයි අපේ හාමුදුරුවනේ." කියූ ජයදාස ස්වාමීන් වහන්සේලාට වැඳ නමස්කාර කළේය. පියංවදා, පුතා, මාමා සහ නැන්දා ද ජයදාස අනුගමනය කළෝය.

"අපේ හාමුදුරුවනේ, ගිලන්පසට රණවරා ටිකක් සූදානම් කරන්නම්."

"රණවරා නම් බොහොම හොඳ අවුසදයක්. එහෙමනම් ටිකක් සූදානම් කරන්න. මේ අපේ දායක මහත්තුරුන්ටත් එක්කම."

ගිලන්පස වැළඳූ ස්වාමීන් වහන්සේ, "මහත්තයෝ මම ආපු කාරණේ කෙලින්ම කියන්නම්කෝ. හැමෝම ඇවිත් මෙතනින් වාඩිවෙන්න. මහත්තයට මතක නේ, අපේ පංසලට දකුණෙන් තියෙන හිස් ඉඩම. අක්කර තුනක් විතර ඇති. අපේ දායක සභාව තීරණය කළා, එතන වැඩිහිටි නිවාසයක් හදන්න කියල. බලන්න මේ පලාතෙ ගමේ කොච්චර වැඩිහිටියන් අසරණ වෙලා ඉන්නවද? යන්න එන්න තැනක් නැතුව. එහෙම නැත්නම් කාත් කවුරුවත් නැතිව. ඉතින් මමත් ඒක අනුමත කළා. ඒක ඉතාමත් මහත්ඵල මහානිශංස ලැබෙන පිංකමක්. මේ ආත්මයෙ පමණක් නෙවි, ආත්ම ගණනාවකටම ගෙනියන්න පුළුවන් පිංකමක්. මහත්තය දන්නව නේ ඒකට හුගක් වියදම අවශ්‍යයි. ඒ සඳහා ආධාර ලබාගැනීම පටන් ගන්න ඉතාම හොඳ, මහත්තයා තමයි කියල, ගමේ හැමෝමත් කීවා. ඒ නිසා මහත්තය ළඟට තමයි, මුලින්ම ආවෙ. හොඳ නැකතකුත් බලල තමයි, අපි පන්සලෙන් පිටත් උණේ."

"අනේ ඒක නම් ඔබ වහන්සේට බුදුබව අත්වෙන පුණ්‍යකර්මයක්. අපේ හාමුදුරුවණේ ඒකට කොච්චර විතර වියදමක් යනවද?"

"දැනට වැසිකිළි පහසුකම්, නාන කාමර එක්ක කාමර 20 කුත්, ධර්ම ශාලාවකුත් තනන්න තමයි, අපි සැලසුම් කළේ. අපේ අර ගුණරත්න ඉංජිනේරු මහත්තය තමයි, මේ වැඩේ බලන්නෙ. ඒ මහත්තයගෙ ඇස්තමේන්තුව අනුව මේ වැඩේට රුපියල් ලක්ෂ 10 ක් විතර යාවි."

"එහෙනම් අපෙ හාමුදුරුවණේ ඕකට ආධාර එකතු කරන්න ඕන නැහැ. ඒ මුළු වියදමම මම දෙන්නම්. හොඳ නැකතක් බලල, ලබන පසළොස්වක වෙන්න ඉස්සරම, අපි වැඩේ පටන් ගනිමු එහෙනම්."

ස්වාමීන් වහන්සේලා ඇතුළු දායක සභාවට ඇතිවූයේ හරිම ජයග්‍රාහී සිනාවක්.

"එහෙමයි අපේ හාමුදුරුවණේ. මමත් අපේ තාත්තටත් අයියලාටත් කියල, ඒකට අවශ්‍ය ඔක්කොම ලී බඩු ලබාදෙන්නම්." ප්‍රියංවදා එහෙම පැවසුවා.

ස්වාමීන් වහන්සේගේ පැතුම අනුව වැඩිහිටි නිවාසයේ වැඩ මාස හයකින් නිම විය. එය ලබන පෝදා හවස 4:30 ට විවෘත කරන බවට පංසල ඉදිරිපිට විශාල පුවරුවක් ප්‍රදර්ශණය කෙරිණි.

***"අද සවස 4:30 ට තුණුරුවන්ගේ ආශීර්වාද මැද 'නිසල වැඩිහිටි නිවාසය' විවෘත කිරීමට යෙදෙන බව, ඔබ සැමට බුද්ධාලම්බන ප්‍රීතියෙන් දන්වා සිටිමු. මෙම උත්සවයට පැමිණෙන ඔබ සැම මෙත් සිතින් පිළිගනිමු."***

ජයදාස ඇතුළු සැමදෙනා, පංසලට ඇතුල් වන විට දුටුවේ, උද්යෝගිමත් සුදු වතින් සැරසුණ කුඩා දරු දැරියන්, බාල හා වැඩිහිටි සැමගෙන් පංසල් භූමිය පිරී ඉතිරී ගොස් ඇති බවය. ➔

දායක සභාවේ, සභාපතිතුමාගේ මඟ පෙන්වීමෙන්, ජයදාස සහ ප්‍රියංවදා සභාවේ අසුන් ගත්තේය. පවුලේ අනික් සැමට, ඉදිරි පෙළේ අසුන් වෙන්කර තිබුණි. ජයදාසට යාබදව දිසා ඇමතිතුමන් හා දිසාපති තුමන් සිටීම යෙහෙකැයි ජයදාසට සිතුණි.

"ජයදාස මහත්තය ගැන, මම අහල බොහෝම පැහැදිලා ඉන්නේ. මහත්තය මේ ගම් පලාතට බොහෝම උදව් උපකාර කරනවලු. මමත් මහත්තයව හම්බවෙන්න තමයි හිටියෙ. කොහොමටත් පංසලේදීම හමුවුණ එක හොඳයි."

"බොහෝම ස්තුතියි! දිසා ඇමති තුමා. මම හිතනව ඒ වගේ දේවල් ගමට, පලාතට අද අවශ්‍යමයි කියල. ආගම්, ජාති, කුල භේද වලින් තොරව, මනුෂ්‍යත්වය තුළින් උදව් කිරීම, ඉතාමත් මහත්මා ගතියක් කියල, අපේ බුදුන් වහන්සේත් දේශනා කරල තියෙනවනේ."

පිටුපස හැරී බැලූ අම්මාට, දෑස් අදහාගත නොහැකි විය. දෙවියනේ මේක හීනයක්ද?

ඒ සමඟම, සෙත් පිරිත් සජ්ඣායනා මැද, මහා සංඝරත්නය වැඩම කරන බවත්, සියලු දෙනාටම නැගිට ආගමික වතාවත් වල නිරත වන ලෙසටත් දැනුම් දෙන ලදි. සියලු වතාවත් වලින් පසු, අනුනායක ස්වාමීන් වහන්සේ විසින් නිවාසය විවෘත කරණු ලැබුයේ, සියලු දෙනාගේම සාදුකාර මධ්‍යයේය.

ප්‍රභූවරු කීපදෙනෙකුගේ කතා වලට පසු, මෙහි පදිංචියට බලා සිටින, විශ්‍රාමික ගුරු මාතාවක් කෙටි කතාවක් කිරීමට සූදානම් බව දැන්වීය. 'සැමියාගේත්, පුතනුවන්ගේත් අභාවයෙන් පසු, ගුරු වෘත්තියෙන් විශ්‍රාමගත් ඇයගේ ගිනි නිවාගැනීමට, මෙම නිවස මහඟු සෙතක් වන බවත්, ඒ සඳහා උපකාර වූ ජයදාස පුතාටත්, ප්‍රියංවදා දුවටත් සදාකල් නිදුක්, නිරෝගී සුවයෙන්, සැනසීමෙන් ජීවත් වීමට ලැබේවා' යයි පතමින් ඇය කතාව අවසන් කළේ, දෑසේ පිරුණ කඳුළු පිස දමමිනි. ඒ කතාව ඇසීමෙන්, ජයදාසගේ ඇසටද කඳුළු පිරුණි. ජයදාස කීප විටක්ම, ඇස් පිසදා ගත් බව ප්‍රියංවදා දුටුවාය. උත්සවය අවසන් වී ගෙදර පැමිණි ප්‍රියංවදාට ඒ ගැන ඇසීමට සිතිණි.

"ජයේ ඇයි ඔයා ඇඬුවෙ, අර අම්මා කතා කරන කොට?"

"අනේ ප්‍රියා, මට සමාවෙන්න. මට මගේ අම්මව මතක් උනා. මේ කතාව මම ඔයාට කලින් කියල නැහැ. මම දවසක් නංගිට ගැහුව කියල, තාත්ත මට හොඳටෝම තැලුව. ඒ නිසා මම ගෙදරින් පැනල ආවෙ, තාත්ත ආයෙත් ගහයි කියල බයට. මම හිතන්නෙ අම්ම තාමත් මාව හොයනව ඇති." ජයදාස කීවේ හඬමින්.

"සිරිතුංග මාමා කීව කතාව නිසා අපි තීරණය කළා, ඔයාගෙන් පවුලේ විස්තර මොකුත්ම අහන්නෙ නැහැ කියල. ඔයා මේ ගැන මට මුලදී කීව නම්, අපිට අම්මව බලන්න යන්න තිබුණනේ මීට කලින්ම. අපි හෙටම යමු අම්මව හොයාගෙන."

"මම දන්නෙ නැහැ, ප්‍රියා මට මොකද උනේ කියල. පසුගිය අවුරුදු පහළොව තිස්සෙම මහා අද්භූත බලවේගයක්, මගේ හිත ගමෙන්, මගෙ අම්මගෙන්, පවුලේ හැමගෙන් වෙන් කළා. ඒත් මට ඔයයි, අනෙක් සියලු සැප සම්පතුයි ලැබුණා. ඒක මගේ දෛවය වෙන්න ඇති."

ගරාජයේ වැඩ සිරිතුංග මාමාටත්, පියදාසටත් පවරා, පුතාව ප්‍රියංවදාගේ දෙමාපියන්ට බාරදුන් ජයදාස, ප්‍රියංවදා සමඟ ගමට යාමට සැරසුණේ ගැහෙන හදවතිනි. ඒ "අනේ දෙවියනේ, මගේ පවුලේ සැම දෙනාම ජීවත්ව ඉන්න ඕන." කියන පැතුමෙන්.

ගමේ පන්සලත්, යාබද පාසැලත් නිසා ඔහුට ප්‍රදේශය හඳුනාගත හැකි විය. එහෙත් නවීන ගොඩනැගිලි නිසා මහගෙදර සොයාගැනීමට නොහැකි විය. ඉදිරිපස කඩයට ගොඩවූ ජයදාස, "මුදලාලි මහත්තයෝ, මේ හරියෙ හිටිය, කරුණාවතී කියල අම්ම කෙනෙක්. දැන් ඉන්නෙ කොහේද?"

"කරුණාවතී නැන්ද මෙතන තිබුණ මහගේ විකුණල, අර කුඹුක ගහ ලඟ ගෙයක් හදාගෙන, දුවත් එක්ක ඉන්නව. මහත්තය සමාජසේවා දෙපාර්තමේන්තුවෙන්ද මහත්තයෝ ?"

"අනේ නැහැ මුදලාලි. බොහොම ස්තුතියි."

වේලාව බැලූ ජයදාසට 11:15 බව පෙනුණි.

"මහත්තයෝ, ඔය ජීප් එක ඔතන තිබුණාවෙ. මහත්තයල එනකන් මම ඒක බලාගන්නම්."

"මේ සිරිසේන, අර කරුණාවතී ආච්චිගෙ ගෙදර, මේ මහත්තයලට පෙන්නපන්."

ගැහෙන හදවතින් ගෙට ඇතුල් වූ ජයදාස දුටුවේ, පිටුපස හැරී බුද්ධ පූජා පවත්වන අම්මාය. ජයදාසට හැඬුම් ආවේ නිතැතිනි.

"අම්මේ."

පිටුපස හැරී බැලූ අම්මාට, දෑස් අදහාගත නොහැකි විය. දෙවියනේ මේක හීනයක්ද?

"අනේ මගේ රත්තරං පොඩි පුතේ. උඹ ගෙදරින් ගියදා ඉඳල, මම කොච්චර දුක් වින්දද? දැනුත් මම මේ පැතුවෙ, උඹව මට ඉක්මනට දකින්න සලස්වන්න කියල."

අම්මා විගස පැන ජයදාස බදා ගත්තේ හීනයක් වගේ. අම්මාගේ දෙපතුල මත වැඳ වැටුන ජයදාස, "අනේ මගේ රත්තරං අම්මේ මට සමාවෙන්න. අම්මට මෙච්චර ගිනි දුන්නට."

ජයදාස අම්මාගේ දෙපතුල තෙත් වන තෙක් හැඬුවේය.

"සිරිසේන පුතේ, පංසලට දුවල අර දම්මිකා ඉස්කෝලෙ නෝනටයි, සුමිත් ලොකු මහත්තයටයි ඉක්මනට එන්න කියපං, නැතිවුණ මල්ලි ඇවිල්ල කියල."

"අනේ මගේ පුතේ දුවේ වාඩිවෙන්න."

"කෝ අම්මේ තාත්ත."

දිග සුසුමක් හෙලූ අම්මා, "උඹ ගියදා ඉඳල මගේ රත්තරං පුතේ, තාත්ත හැම තැනම උඹව හෙව්වා. තාත්ත ගැහුව නිසා උඹ ගෙදරින් ගියා කියල හරිම හිත අමාරුවෙන් හිටියෙ. අවුරුදු දෙකකට උඩදී තාත්ත නැති උනා මගේ පුතේ."

අම්මා ඉකි ගසයි.

"තාත්ත නැතිවෙන්න ඉස්සෙල්ලා, අපේ ලොකු හාමුදුරුවන් වහන්සේ උඹේ හඳහන බලල කීව, උඹ කොහේ හරි ජීවත්ව ඇති, කවද හරි අම්ම බලන්න ඒවිය, ඒ එන්නෙ හරිම ප්‍රසිද්ධ කෙනෙක් වෙලා කියල. ඒත් තාත්තගෙයි, උඹෙයි හඳහන් වල තියෙනවලු, දෙන්නට එකට ඉන්න බැහැ කියලත්."

"කොහොමද අම්මේ, අපේ ලොකු හාමුදුරුවො." ➔

"උන්වහන්සේත් ගිය අවුරුද්දෙ අපවත් වුණා, මගේ පුතේ. තාත්ත නැති වුණාට පස්සෙ, උන්නාන්සෙ තමයි මගේ හිත හොඳටම හැදුවේ. මගේම අයිය නිසා උන්නාන්සේ නිතරම මෙහාට වැඩිය." හඬමින්ම ජයදාසට අම්ම එහෙම කිව්වා.

ජයදාස නෙතඟින් වැටෙන කඳුළු පිසදා ගැනීමට උත්සාහ ගත්තේ නැත. නංගී පැමිණ දණගසා වඳින විටත්, ජයදාස සිටියේ දෑස් පියාගෙන අතීත ආවර්ජනයකය.

"අනේ මගේ රත්තරං පොඩි අයියේ, මට සමාවෙන්න. එදා අයිය මට ගැහුව කියල තාත්තට කීව නිසා තමයි, අයිය තාත්තගෙන් ගුටි කෑවෙ. එදායින් පස්සෙ මගේ රත්තරං අයියව දැන් තමයි දැක්කෙ. අනේ මගේ අයියේ මට සමාවෙන්න."

"නංගි මට වරදක් කළේ නැහැනෙ නංගි. එදා නංගිගෙ අඹ ගෙඩිය කාලා, නංගි අඬන කොට නංගිට ගැහුවෙත් මම නේ. ඒ නිසා මමයි නංගිගෙන් සමාව ඉල්ලන්න ඕන."

"ඒත් අයිය ගෙදරින් ගිය දා ඉඳල මගේ හිත මටම දොස් කියනව."

"අනේ මගේ රත්තරං මල්ලියේ, උඹ ආවද? ඒක අපිට හරිම සැනසීමක්. අම්ම නම් හැමදාම මල්ලි, එයි කියල බලන් හිටිය."

ජයදාස හා ප්‍රියංවදා අයියාට වැන්දේ, මහත් ස්නේහයෙන්.

"අම්ම හැම පෝයටම සිල් ගන්නවා. හැමදාම මල් තියල බුදුන් වැඳල ප්‍රාර්ථනා කරන්නෙ ඉක්මනට මල්ලිව දකින්න සලසන්න කියල. අපේ නායක හාමුදුරුවො කීව නිසා අම්ම විශ්වාස කළා, අම්මව හොයාගෙන, මල්ලි කවදහරි ඒවි කියල. අනේ මගේ රත්තරං මල්ලියේ, දැන් අපි ඔක්කොටම හරිම සැනසීමක්. නංගිත් මතක් වෙන, මතක් වෙන වාරයට අඬනව, මල්ලි ගෙදරින් ගියේ එයා නිසයි කියල."

"තාත්තත්, ලොකු හාමුදුරුවන් වහන්සෙත් අපෙන් ඈත් උණ එක ගැන මගේ හිත නම් වාවන්නෙම නැහැ. අප ලඟදීම ලොකු සාංඝික දානයක් දීලා, ඒ දෙන්නාට උපදින, උපදින හැම ආත්මයකම, නිවන් දකින තුරු අපි එක්කම ඉන්න ලැබෙන්න කියල, පින් කරමු."

"එහෙනම් අයියේ, අපි දෙන්න අද මෙහේ ඉන්නව, අම්ම එක්ක. හෙට ගෙදර ගිහිල්ලා, ලබන ඉරිදට අපේ පුතත් එක්ක එන්නම්, අම්මව එහේ එක්කගෙන යන්න. අපේ පුතත් අම්මව දැක්කම හරියට සතුටු වේවි."

ජයදාස එසේ කීවේ කුඩා දරුවෙකු මෙන් අම්මාගේ උකුලේ හිස තබාගෙන. අම්මා ජයදාසගේ හිස අත ගෑවේ හරිම සෙනෙහසින්. මේ දුටු ප්‍රියංවදාගේ දෑසට කඳුළු නැගුණේ නිරායාසයෙන්. ඒ අමරණීය මව් සෙනෙහස දැකීමෙන්. ඇය නැවත වරක් අම්මාගේ දෙපා වැන්දේ හද උතුරායන භක්තියෙන්.

ලේ කිරි කොට පෙවූ මගෙ රත්තරන් පුතේ
නුඹ මට නැවත ලැබුණේ පෙර පිනින් පුතේ
නිවන් දකින තුරු හැම භවයකම පුතේ
නුඹ, අප හැම එකට විසුමට පතමු පුතේ

**නිමි**

*ආචාර්ය ෂෙල්ටන් පීරිස්*
*සිඩ්නි විශ්ව විද්‍යාලය*